රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 29/95(IV)

මගේ අංකය: II/706 ඒ 206/56/ඩීඒ 32
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1999 නොවැම්බර් මස 24 වැනි දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**ත්‍රස්තවාදී බලපෑම් සහිත ප්‍රදේශයන්හි සිවිල් පරිපාලනයේ**
**<u>යෙදී සිටින රාජ්‍ය නිලධාරීන්ට දිරිගැන්වීමේ දීමනා</u>**

1995.09.22 දිනැති අංක 29/95, 1996.05.20 දිනැති අංක 29/95(1), 1996.09.11 දිනැති අංක 29/95(II) හා 1998.05.29 දිනැති අංක 29/95(III) චක්‍රලේඛ ඔබේ අවධානය යොමු කරමි.

02. පහත නම් සඳහන් බල ප්‍රදේශයන්හි සිවිල් පරිපාලනයේ නිරත නිලධාරීන්ට එම ප්‍රදේශයන්හි **සිවිල් පරිපාලනය නැවත ස්ථාපිත කළ දින සිට වර්ෂ 2 ක කාලයක් සඳහා මෙකී දිරිදීමනාව ගෙවිය යුතුය යන සීමා කිරීමට** යටත්ව 1997.11.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2/97(III) න් සංශෝධිත 1997.01.15 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 2/97 නව වැටුප් චක්‍රලේඛය අනුව, මාසික ඒකාබද්ධ වැටුපෙන් 10% කට සමාන දීමනාවක් දිරි ගැන්වීමේ දීමනාවක් වශයෙන් ගෙවීමට රජය තීරණය කර ඇත.

| <u>දිස්ත්‍රික්කය</u> | | <u>ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය</u> |
|---|---|---|
| පොළොන්නරුව | 1. | මැදිරිගිරිය |
| | 2. | ලංකාපුර |
| | 3. | දිඹුලාගල |
| | 4. | තමන්කඩුව |
| අනුරාධපුරය | 1. | නුවරගම් පළාත මධ්‍යම |
| | 2. | විලච්චිය |
| | 3. | මැදවච්චිය |
| | 4. | කැබිතිගොල්ලෑව |
| | 5. | පදවිය/වැලිඔය (උප කාර්යාල බල ප්‍රදේශය) |
| | 6. | කහටගස්දිගිලිය |
| | 7. | හොරොව්පතාන |
| | 8. | නොච්චියාගම |
| | 9. | ගලෙන්බිඳුනු වැව |
| | 10. | පළුගස්වැව |
| පුත්තලම | 1. | කල්පිටිය |
| | 2. | වනාතවිල්ලුව |
| | 3. | කරුවලගස්වැව |
| මඩකලපුව | 1. | සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ |
| අම්පාර | 1. | දෙහිඅත්තකණ්ඩිය හැර සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ |

| | | |
|---|---|---|
| ත්‍රිකුණාමලය | 1. | සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ |
| වව්නියාව | 1. | සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ |
| මන්නාරම | 1. | සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ |
| යාපනය | 1. | සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ |
| | 2. | සියළුම දූපත් |
| කිලිනොච්චි | 1. | සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ |
| මුලතිව් | 1. | සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ |
| මොණරාගල | 1. | සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය |

03. අදාළ ප්‍රදේශයේ සිවිල් පරිපාලනය නැවත ස්ථාපිත කළ දිනය ආරක්ෂක කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විමසා දැනගත යුතුය.

04. දීමනා ගෙවීම 1999.07.01 සිට 1999.12.31 දින දක්වා හෝ ප්‍රදේශයේ ත්‍රස්තවාදී ක්‍රියා නොමැති බවට රජය නිවේදනය කරනු ලබන දින හෝ යන දින දෙකෙන් පළමුව එළඹෙන දින දක්වා පමණක් ක්‍රියාත්මක විය යුතුය.

05. ස්ථිර සේවයට අයත් නොවන රජය නිලධාරීන් සම්බන්ධයෙන් මෙකී දීමනාව අදාල මාසය තුළ සේවය කරන ලද දින ගණන පදනම්කර ගෙන ගෙවිය යුතුය.

06. දීමනා ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන 1999 වර්ෂය සඳහා දැනටමත් වෙන් කර ඇති ප්‍රතිපාදන සීමාව තුළ සළසා ගත යුතුය.

07. නිලධාරීන් ලබා ගන්නා නිවාඩුවලට හා ගුරුවරුන් ලබා ගන්නා නිවාඩුවලට අමතරව පාසල් නිවාඩු කාලය වෙනුවෙන් ද දීමනාව සමානුපාතිකව අඩු කළ යුතුය.

08. ත්‍රස්තවාදී බලපෑම් සහිත ප්‍රදේශයක ස්ථිරව සේවය කරන නමුත්, එම ප්‍රදේශයෙන් බැහැර ත්‍රස්තවාදී බලපෑම් රහිත ප්‍රදේශයක, සේවය/පුහුණුව ආදිය සඳහා ගිය කාලය වෙනුවෙන් දිරි දීමනා නොගෙවිය යුතුය.

09. ත්‍රස්තවාදී බලපෑම් රහිත ප්‍රදේශයක ස්ථිරව සේවය කරන, එහෙත් රාජකාරී අවශ්‍යතා මත ත්‍රස්තවාදී බලපෑම් සහිත ප්‍රදේශයක සේවයෙහි නිරත කරවනු ලබන නිලධාරීන්ට ඔවුන් එසේ සේවයේ නිරතවන දින ගණනට සමානුපාතිකව දිරිදීමනාව ගෙවිය යුතුය. (මෙහිදී මාණ්ඩලික නිලධාරියෙකුට, දිනකට ගෙවිය යුතු දීමනාව, 10% මුළු දීමනාවෙන් 1/20 කටද, මාණ්ඩලික නොවන නිලධාරියෙකුට දිනකට ගෙවිය යුතු දීමනාව, 10%මුළු දීමනාවෙන් 1/30 කටද සමානවිය යුතුය.)

(මහින්ද බන්දුසේන)
ලේකම්
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය